කථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2876169, 011-2876181
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E - mail: info@psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
# அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
# OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
**No. 1200/9, Rajamalwatta Road, Battaramulla.**

මගේ අංකය / எனது இல. / My No.: PSC/APP/01/36/2019
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2019.10. 14

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්

පළාත් ප්‍රධාන ලේකම්වරුන්

දිස්ත්‍රික් ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

<u>මැතිවරණ කාලසීමාව තුළ විශ්‍රාමික රජයේ නිලධරයන් නැවත සේවයේ යෙදවීම</u>

මැතිවරණ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01-2019 හා බැඳේ.

02. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2018 යටතේ විශ්‍රාමික නිලධාරීන් නැවත සේවයේ යෙදවීම ද පත් කිරීම් යටතට ගැනෙන බැවින් 2019.09.18 දින සිට 2019.11.30 දක්වා කාලය තුළ විශ්‍රාමිකයින් නැවත සේවයේ යෙදවීම සඳහා සිදු කරනු ලබන නව ඉල්ලීම් 2019.12.01 දිනෙන් පසු ඉදිරිපත් කරන ලෙස දන්වමි.එමෙන්ම පසුව අනුමැතිය ලබා ගැනීමේ අපේක්ෂාවෙන් එම කාලය තුළවිශ්‍රාමිකයින් නැවත සේවයේ නොයෙදවිය යුතුය.

03. එමෙන්ම මෙම කාලය තුළ අත්‍යාවශ්‍ය සේවා අවශ්‍යතාවය මත විශ්‍රාමික නිලධරයෙකු නැවත සේවයේ යෙදවීමට අවශ්‍ය වේ නම් ඒ සඳහා මැතිවරණ කොමසාරිස්ගේ එකඟතාවය සහිතව එම ඉල්ලීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

04. මේ වන විට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත එවා ඇති එවැනි ඉල්ලීම් 2019.12.01 දිනෙන් පසු නැවත ඉදිරිපත් කරන ලෙසද දන්වමි.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

එම්.ඒ.බී. දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

පිටපත් :-

1. ජනාධිපති ලේකම්, ජනාධිපති ලේකම් කාර්යාලය - කරු.දැන ගැනීම සඳහා
2. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්, අමාත්‍ය මණ්ඩල කාර්යාලය - කරු.දැන ගැනීම සඳහා
3. ලේකම්, මැතිවරණ කොමිෂන් සභාව - කරු.දැන ගැනීම සඳහා
4. විගණකාධිපති - කරු.දැන කිරීම සඳහා
5. ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව - කරු.ක්‍රියා කිරීම සඳහා
6. ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව - කරු.ක්‍රියා කිරීම සඳහා